## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

----------------------------------

### 1.6.1 අත්තිකාරම්

-----------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩ හා සේවා සැපයීමෙන් පසු ගෙවීම් කලයුතු වුවත් අවස්ථා 11 ක දී අළුත්වැඩියා කටයුත්ත ආරම්භයේදීම ඊට අදාළ සම්පූර්ණ මුදලම වන එකතුව රු.408,413 ක් අත්තිකාරම් වශයෙන් ලබාගෙන නිලධාරීන් අත රඳවාගෙන තිබුණි. | අලුත්වැඩියා කිරීම් නිම කිරීමෙන් අනතුරුව පමණක් සැපයුම්කරුට ගෙවීම් සිදු කරනු ලැබේ. එනමුත් අලුත්වැඩියාව අවසන් කළ සැනින් එම සැපයුම්කරුට මුදල් ගෙවිය යුතු හෙයින් අත්තිකාරම් ලබා ගෙන අප ආයතන නිළධාරියා භාරයේ තබා ගනු ලැබේ. | සේවා කටයුතුවලදී අදාළ කාර්යය නිම කිරීමෙන් පසුව ගෙවීම් සිදුකළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 හා 2015 ජුලි 14 දිනැති අංක 03-2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) | අත්තිකාරම් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 08 දෙනෙකු වෙත අවස්ථා 15 කදී එකතුව රු.213,906ක අත්තිකාරම් ලබා දී තිබුණි. | අත්තිකාරම් ලබාදීම හුදෙක් මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමා කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රම නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| | | (ii) | අත්තිකාරම් ලබාගත් පසු අදාල කාර්යය කඩිනමින් නිමකොට පියවිය යුතු වුවත් අවස්ථා 26 කදී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු1,497,569 ක අත්තිකාරම් පියවීම සඳහා මාස 1 ½ සිට මාස 11 ½ දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | අලුත්වැඩියා කටයුතු කිරීමට බලාපොරොත්තු කාල සීමාව ඉක්මවා කාලය ගත වී ඇති බැවින් පියවීමට වැඩි කාලයක් ගන්නා ලදී. මින් ඉදිරියට අත්තිකාරම් පියවීම දින 14 ක් ලබාදීම අනිවාර්ය කිරීමට පියවර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| | | (iii) | අත්තිකාරම් ලබාදිමේ දී ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ට සීමා විය යුතු වුවත් අවස්ථා 03 කදී රු.188,575 ක සිට රු.397,900 ක පරාසයක් තුල අත්තිකාරම් ලබා දී තිබුණි. | අවස්ථා තුනෙහිදීම අත්තිකාරම් ලබා දී ඇත්තේ අන් කිසිම මාර්ගයෙන් එම ගෙවීම් කිරීමට හැකියාවක් නොමැති බැවිනි. නමුත් මින් ඉදිරියට විගණන කමිටුවේ උපදෙස් පරිදි එවැනි අත්තිකාරම් වලින් වැලකීමට පියවර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 11වන කොටසෙහි 15(V) උපවගන්තිය | | උසස් අධ්‍යාපන ආයතන විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | මෙම පාඨමාලාවන්ට අදාල අතුරු ව්‍යවස්ථා කොළඹ විශ්වවිද්‍යාල පූර්ව ව්‍යවස්ථාදායක කමිටුව | විශ්වවිද්‍යාල පනතට අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතු වුවත් , ආයතනය විසින් දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලා 05ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මගින් කිහිපවරක් සමාලෝචනය කර ඇති අතර ඒවා කොළඹ විශ්වවිද්‍යාල පාලක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී. | |
| (ඇ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව රු.19,224,085 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අධ්‍යනය කාර්ය මණ්ඩල සාමාජික අනුමත වැඩ නියාමාවලින්ට සහ කාල සටහන් වලට අනුකූලව ආයතනයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ තම රාජකාරී කටයුතු කරගෙන යන බව වැඩිදුරටත් දන්වමි. මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන බැවින් මේ සම්බන්ධව කොළඹ විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග අනුගමනය කරන බවද වැඩිදුරටත් දන්වමි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා දක්වා ඇති ආකෘතියට අනුව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2019 වර්ෂයේ සිට පරිගණක මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,847,672 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,602,236 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.754,564 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු 914,800.ක් වටිනා නැවත භාවිතයට ගත නොහැකි අයිතම 31ක් ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල භාණ්ඩ බැහැර කිරීම ප්‍රමාද වූයේ කාර්ය මණ්ඩල ඌණතාවය සහ මෙම භාණ්ඩ විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන් මගින් පරීක්ෂා කර ඒ සදහා මිල ගණන් යෙදවීමට ප්‍රමාද වූ බැවින්ය. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අදාල කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.12,120,552 ක් පරිත්‍යාග අරමුදල සහ වත්කම් ප්‍රතිසම්පාදන අරමුදල්හි පැවති අතර වර්ෂ 02 ක සිට මෙම අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා යොදවා නොතිබුණි. | පරිත්‍යාග අරමුදලෙන් මහාචාර්ය එරික් කරුණානායක අනුස්මරණ ශිෂ්‍යත්ව ප්‍රදානයට මුලික කටයුතු පිළියෙල කර 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ Asset Replacement Fund අරමුදලෙන් රු 4,025,000 ක් වටිනා Real Time PCR යන්ත්‍රයක් මිළදී ගැනීමට , 2018.09.03 ලංසු කැඳවා 2018.12.03 දින මිළදී ගැනීමේ ඇණවුමක් නිකුත් කර තිබේ. එම යන්ත්‍රය සඳහා 2019.02.11 දින මුදල් ගෙවා තිබේ. එහෙයින් Asset Replacement Fund අරමුදල 2018 වර්ෂයේ දී ප්‍රයෝජනයට ගෙන නොතිබු බවට එකඟ විය නොහැක. | අරමුදල් පිහිට වූ කාරණය සඳහා උපරිම වශයෙන් යොදා ගත යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) මාර්ගෝපදේශය පරිදි කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකේම සේවය නොකළ යුතු වුවද නියැදි පරීක්ෂාවේදී රු.434,240 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදී ගැනීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුවට ආයතනයේ ප්‍රසම්පාදන කමිටුවෙහි සාමාජිකයෙකු පත්කර තිබුණි. | මින් ඉදිරියට එවැනි පත් කිරීම් වලින් වැලකී සිටීමට පියවර ගන්නා ලදී | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය 47 ක් වන අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉන් තනතුරු 15 ක පුරප්පාඩු පැවතුණි. | අනධ්‍යයන තනතුරු පුරප්පාඩු අතරින් කළමණාකරණ සහකාර (පොත් තබන්නා) සහ කළමණාකරණ සහකාර (සරජ) තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගැනීම් සිදුවේ. පුරප්පාඩු වී ඇති කළමණාකරණ සහකාර තනතුරු 04 හා තාක්ෂණ නිලධාරී තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛණ 876 ප්‍රකාරව අමාත්‍යාංශ නාම ලේඛන අවස්ථා ගණනාවකදීම ඉල්ලීම් කර තිබුණත් පැවති ප්‍රායෝගික දේශපාලන තත්ත්වය මත එම නාමලේඛන ලබා ගැනීම දුෂ්කර විය. මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරන තෙක් එම තනතුරු වල වැඩකටයුතු කිරීමට වැඩ පැවරුම් පදනම මත සේවකයන් බඳවාගෙන ඇති බව කාරුණිකව දන්වමි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන Molecular life science හා Cellular & molecular Immunology යන ප්‍රධාන MSC පාඨමාලාවන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය සඳහා ශිෂ්‍යයින් 50 ක් බැගින් බඳවා ගත හැකි වුවද සත්‍ය වශයෙන් බඳවා ගෙන තිබූ ප්‍රමාණය පිළිවෙලින් 12 ක් හා 7ක් විය. එනම් සියයට 25 ක් හා සියයට 15 ක් වැනි අවම මට්ටමක පැවතුණි. | ක්‍රියාකාරී සැලැස්ම යනු අනාගතයේදී ලඟා කර ගැනීමට අපේක්ෂිත පූර්ව උපකල්පන තත්වයකි. විද්‍යාපති උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගැනීම සිදු කරනු ලබනුයේ තෝරා ගැනීමේ අභියෝගතා පරීක්ෂණ යේ ප්‍රතිඵල මත සහ ඉන් අනතුරුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. ඒ අනුව 2018 වර්ෂයේදී විද්‍යාපති පාඨමාලාවන් වන Molecular Life Science හා Cellular & Molecular Immunology යන පාඨමාලාවන් සහ උපාධි සඳහා ශිෂ්‍යයින් 50 ක් බඳවා ගැනීමට අපේක්ෂා කළ අදාළ සුදුසුකම් | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ලෙස සකස් කළ යුතු අතර ආයතනයේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි ද කළමණාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සපුරා තිබූ ශිෂ්‍යයින් 12 ක් සහ 07 ක් පමණක් අදාළ පාඨමාලා සඳහා බඳවා ගෙන ඇත. | |
| (ආ) | 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීමේ දී සැලැස්මෙහි දක්වා තිබූ අරමුණු 09 කට අදාල ක්‍රියාකාරකම් 14 ක් ඉටු වී නොතිබුණි. | පර්යේෂණ 3ක් 2018 වර්ෂය පුරා සිදු කරගෙන ගිය අතර අවසන් පර්යේෂණ නිබන්ධනය 2019 වර්ෂයේදී භාර දීමට නියමිතය.<br>අරමුණු 9ක් 2018 වර්ෂයේදී ඉටු කර ගැනීමට නොහැකි වී ඇති අතර 2019 වර්ෂයේදී වන විට එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාත්මක වන බව 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙහි ප්‍රගති සමාලෝචනය සඳහා අදාළ වගකීම් පවරා ඇති අය විසින් දැනුම් දී ඇත.<br>එක් අරමුණක් අදාළ ක්ලෝන (clones) නොතිබීම හේතුවෙන් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇත.<br>එක් පුහුණු වැඩමුලුවක් 2018 වර්ෂයේ පවත්වා ඇති අතර තවත් වැඩමුලුවක් 2019 වර්ෂයේ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ලෙස සකස් කළ යුතු අතර ආයතනයේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි ද කළමණාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. |

**4.2** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයට අදාල අයවැය ගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ඉපයූ ආදායම අයවැය ගත ප්‍රමාණයට වඩා සියයට 9 කින් අඩු වී තිබූ අතර වැය විෂයයන් 03 ක් සඳහා සියයට 8 සිට සියයට 95 දක්වා විචලනයන් පැවතුණි. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වූ හෙයින්ද, රජයේ වාර්ෂික ප්‍රදානයන් අඩු වූ හෙයින්ද පුරෝකථනය කළ ආදායමට වඩා සත්‍ය ආදායම අඩු විය.නමුත් පවත්නා උද්ධමන තත්ත්වය යටතේ ආයතනය නඩත්තු කළ යුතු බැවින් සැපයුම් හා නඩත්තු වියදම් අයවැයගතකළ අගයට වඩා වැඩි අගයක් ගන්නා ලදී. | අයවැය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |